**ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය මගින් කාබනික පොහොර නිෂ්පාදනය සඳහා සිදු කරන ආයෝජනය කෙරෙහි ලාභයේ බලපෑම**

තිලිනි යූ මධුසංඛ [1] මොහොට්ටාල පී කුලරත්න [2]

ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කාබනික පොහොර නිෂ්පාදනය කිරීම වර්තමාන ලෝකයේ පුළුල් ලෙස අවධානයට යොමු වී ඇති කරුණකි. නමුත් ශ්‍රී ලංකාවද ඇතුලුව ලෝකයේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කාබනික පොහොර නිෂ්පාදන ක්ෂේත්‍රය තුළ මහා පරිමාණ මට්ටමින් ආයෝජනයන් සිදු කිරීම සම්බන්ධයෙන් පවතින යොමු වීම පහත් මට්ටමක පවතී. යම් නිෂ්පාදන ක්ෂේත්‍රයක් තුළ ආයෝජනයන් සිදු කිරීමේදී සලකා බලනු ලබන ප්‍රධාන සාධකයක් වන්නේ ලාභයයි. ඒ අනුව මෙම අධ්‍යයනයේදී මූලික අරමුණ වූයේ සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හරහා කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යොදවන ආයෝජන මට්ටම තීරණය වීම කෙරෙහි කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය ආශ්‍රිත ලාභදායිත්වයේ ස්වභාවය බලපාන්නේද නැද්ද යන්න පිළිබඳව අධ්‍යයනය කිරීමයි. එහිදී ගම්පහ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා බලප්‍රදේශ පහක් ආවරණය වන පරිදි හඳුනාගන්නා ලද කාබනික පොහොර නිෂ්පාදනය කරන නිෂ්පාදන ආයතන අතරින් සසම්භාවී ලෙස තෝරා ගනු ලැබූ 60% නියැදියක් ආශ්‍රයෙන් ලබාගත් තොරතුරු භාවිතයෙන් අධ්‍යයනය සිදුකර ඇත. පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය ආශ්‍රයෙන් සිදුකරන ලද මෙම අධ්‍යයනයේදී හඳුනාගත් ප්‍රධාන කරුණක් වූයේ ශ්‍රී ලංකාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ කාබනික පොහොර නිෂ්පාදන ක්ෂේත්‍රයේ ආයෝජනය පහත් මට්ටමක පැවතීම කෙරෙහි ලාභය බලපෑමක් සිදු නොකරන බවයි.

මුඛ්‍ය පද ¦ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය, කාබනික පොහොර, ආයෝජනය, ලාභය

[1] පර්යේෂණ මධ්‍යස්ථානය" සමාජීයවිද්‍යා පීඨය" කැලණිය විශ්වවිද්‍යාලය" ශ්‍රී ලංකාව. thilinimadushankaa@gmail.com

[2] ආර්ථිකවිද්‍යා අධ්‍යයන අංශය" සමාජීයවිද්‍යා පීඨය" කැලණිය විශ්වවිද්‍යාලය" ශ්‍රී ලංකාව. kule_econ@kln.ac.lk